# ආදරණීය ගුරුවරුණි

අප ජීවත්වන සෑම තත්පරයක් ම
විශ්වයේ අපූර්ව හා
අසම සම නිමේශයකි
එය නැවතත් නො පැමිණෙයි.
එහෙත් දරුවන්ට අප
මේ උගන්වන්නේ මොනවාද?
දෙකයි දෙකයි  හතරයි
ප්‍රංශයේ අගනුවර පැරිසියයි යන දේ
ය.
තමන් කවුරුන් දෑ යි
අප ඔවුන්ට උගන්වන්නේ කවරදා ද?
ඔවුන්ට කියා දිය යුත්තේ
ඔබ දන්නවා ද ඔබ කවුරුන් ද කියා
ඔබ ආශ්චර්යවත් ය.....
ඔබ අසම සම ය.
පෙර කිසි කලෙක
ඔබ වැන්නකු මිහි පිට නැත.
බලන්න ඔබේ ශරීරය දෙස
ඔබ කෙතරම් විශ්මය ජනක ද?
ඔබේ දෙපා, ඔබේ දෑත් , ඇඟිලි
චලනය වන සැටි
කෙතරම් චමත්කාර ජනක ද?
ඔබට ෂේක්ස්පියර් හෝ
බිතෝවන් වැන්නකු විය හැකි ය.
ඔබ පතන ඕනෑ ම අයකු වීමට
ඕනෑම දෙයක් කිරීම ට
ඔබට ශක්තිය ඇත.
ඔබ ඇත්තෙන් ම ආශ්චර්යවත් ය.
ඉතින් මෙබඳු වූ ඔබට
තමා වැනි ම ආශ්චර්යවත් වූ
තවත් මනුෂ්‍යයෙකුට
කෙසේ නම් හිංසා කළ හැකි ද?
ඔබ එකිනෙකා තම තමන්
ආදරයෙන් රැකබලා ගත යුතු ය.
එසේ ම ඔබ අප එක් ව
මෙම ලෝකය එහි වසන දරුවන් ට
වඩාත් සුදුසු තැනක් කරනු සඳහා
වැඩ කළ යුතු ය.

- පැබ්ලෝ කසල්ස් -